# පැරණි ශ්‍රී ලංකාවේ ආයුර්වේද ඉතිහාසය
# (අනුරාධපුර හා පොළොන්නරු යුගයන් ඇසුරින්)

කරුණාරත්න යූ. ඩී. පී. ටී.
තාවකාලික සහකාර කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

**සංක්ෂිප්තය**

ආයුර්වේදය යනු සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමයකි. මෙහි සරල අදහස "දීර්ඝායුෂ පිළිබඳ දැනුම" යන්න යි. ඉන්දියාවෙන් ආරම්භවන්නට ඇතැයි සැලකෙන ආයුර්වේදයේ නිර්මාතෘ ධන්වන්තරී ඍෂිවරයා යි. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව ඉන්දියානු උපමහද්වීපයට ආවේණික වූ පැරණි වෛද්‍ය ක්‍රමයකි. එතෙක් ලංකාවේ පැවති වෛද්‍ය ක්‍රමය වූයේ "දේශීය චිකිත්සාව" හෙවත් "සිංහල වෙදකම යි". මේ අනුව ලංකාවට ආයුර්වේදය ලැබෙන්නේ අවුරුදු තුන්දහසකටත් වඩා වර්ධනය වූ ඉන්දියාව වෙතිනි. මෙම පර්යේෂණයේ දී අරමුණ වූයේ අනුරාධපුර, පොළොන්නරු යුගවල දී පැවති ආයුර්වේද වෛද්‍ය ඉතිහාසය විමර්ශනය කිරීම යි. මෙහි දී ප්‍රධාන වශයෙන් සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක සාධක මගින් කරුණු ගොනුකර ඇත. දේශීය සාහිත්‍ය මූලාශ්‍රය ගත් විට විශේෂයෙන් මහාවංසයේ ක්‍රි. පූ. 4වන සියවසේ පණ්ඩුකාභයගේ රාජ්‍ය සමයෙන් ආරෝග්‍යශාලා ඉදි කිරීම ආරම්භ වූ අතර ප්‍රාග්බෞද්ධ යුගය වන විටත් ලංකාවේ වෛද්‍ය ක්‍රමය පැවති බව මින් පැහැදිලි වේ. අනුරාධපුර යුගයේ දී සිංහල රජවරු අතර වෛද්‍යවරුන් ලෙස ද කටයුතු කළ රජවරු රැසක් සිටි අතර බුද්ධදාස රජු ඒ අතර වැදගත් වේ. ඔහු දක්ෂ ශල්‍ය වෛද්‍යවරයෙකි. මේ යුගයේ දී ගිහි පැවිදි දෙපිරිසට ම ද ආරෝග්‍යශාලා ඉදිකර දී ඇති බව මිහින්තලේ හා ආලාහන පිරිවෙන ආශ්‍රිත ව හමු වූ නටබුන්වලින් පැහැදිලි වේ. ක්‍රි. ව. 8, 9 සියවස්වල දී සිද්ධ හා යුනානි වෛද්‍ය සම්ප්‍රදාය ලංකාවේ ආයුර්වේදය හා වර්ධනය විය. පොළොන්නරු යුගය වන විට මෙම ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ඉතා දියුණු මට්ටමක පැවති බව සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක සාධක මගින් පැහැදිලි වේ. පොළොන්නරු අවධියේ ද ගිහි පැවිදි දෙපිරිසට ම ආරෝග්‍යශාලා ඉදි කර දී ඇති අතර වෛද්‍ය කටයුතු සඳහා සේවය කළ පාලකයන් අතර පළමු වන පරාක්‍රමබාහු වැදගත් වේ. අද වනවිට ලංකාවේ පවතින ආයුර්වේද වෛද්‍ය ක්‍රමය උතුරු ඉන්දීය ආයුර්වේද වෛද්‍ය සම්ප්‍රදාය, දකුණු ඉන්දීය සිද්ධ වෛද්‍ය සම්ප්‍රදාය හා අරාබි යුනානි වෛද්‍ය සම්ප්‍රදාය සහ ශ්‍රී ලංකාවේ පාරම්පරික චිකිත්සා ක්‍රමය යන සියල්ලෙහි එකතුවකි. ඉන්දියාවෙන් ලැබුණු දායාදයක් වුවත් අනුරාධපුර හා පොළොන්නරු යුගවල දී දියුණු ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් පැවති බව මින් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද:** ආයුර්වේදය, වෛද්‍ය, පොළොන්නරු, අනුරාධපුර

**විද්‍යුත් ලිපිනය:** sumuduprarthana92@gmail.com